# දිළිඳුකම පිටු දැකීම තුළින් තිරසාර සංවර්ධනයක් උදෙසා බෞද්ධ ඉගැන්වීම්හි දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඒ. කේ. සී. අයේෂානි අබේසිංහ*[1] *අමුගොඩ ධම්මජීව හිමි*[2]

දිළිඳුකම පිටු දැකීම තුළින් තිරසාර සංවර්ධනයක් උදෙසා බෞද්ධ ඉගැන්වීම්හි දායකත්වය නම් මෙම පර්යේෂණයේ මූලික උපන්‍යාසය වනුයේ දිළිඳුකම පිටුදැකීම පිළිබඳ බෞද්ධ ආකල්පය සැබවින් ම ප්‍රායෝගික වූ සදාචාරාත්මක පිළිවෙතක් බව පෙන්වා දීමයි. එමගින් එහි වර්තමාන අවශ්‍යතාව උදෙසා න්‍යායාත්මක හා ප්‍රායෝගික අංශ අධ්‍යයනයෙහි උපයෝගීතාව තුළින් තිරසාර සංවර්ධනය ඇති කළ හැකි බව පෙන්වාදීම අරමුණ වේ. සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයන ක්‍රමවේදය යටතේ ගොඩනැගුණු මෙම පර්යේෂණයේ දී ත්‍රිපිටකයත් ඒ හා බැඳි අටුවා ආදි ප්‍රාථමික මූලාශ්‍රයත් අධ්‍යයන ක්ෂේත්‍රයට සමගාමී ව රචිත අද්‍යතන ග්‍රන්ථ, ලිපි ආදි ද්විතීයක මූලාශ්‍රයත් උපයෝගී කොට ගැනේ. බුදුදහමට අනුව දිළිඳුකම ලෞකික හා ආධ්‍යාත්මික අරමුණු සාක්ෂාත් කරගැනීමෙහි ලා බාධාවක් වන අතර සමාජීය වපසරිය තුළ දිළිඳුකම යන්න සාපේක්ෂ කොට ගැනේ. එය පුද්ගල දෘෂ්ටික වූ සංකල්පයකි. දිළිඳුකම යන්න නිර්වචනය කිරීමේ දී ආගමික, භෞතික, සංස්කෘතික ආදි විවිධ මානයන් භාවිත කර ඇති අතර එහි දී සමාජ, සංස්කෘතික හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ ව ද විෂය වේ. දිළිඳුකම තුළින් සමස්ත සමාජයේ ම අවගමනය සාධනය වන අතර එතුළින් සමාජ, ආර්ථික, දේශපාලනික හා පාරිසරික වසයෙන් විවිධ අර්බුදයන්ට මුහුණ දීමට සිදු වේ. බුදුදහම තුළ දිළිඳුකම සාධාරණීකරණය නො කරයි. දිළිඳුකම ප්‍රතික්ෂේප කරන බුදු දහම ධනයේ අවශ්‍යතාව පෙන්වා දෙනුයේ දුප්පත්කම කාමභෝගී ගිහියනට දුකක් බව අවධාරණය කරමිනි. දිළිඳුකම පිටුදැකීම උදෙසා පිළියම් රාශියක් බෞද්ධ සූත්‍ර දේශනා තුළින් ඉදිරිපත් වන අතර එතුළින් සමාජගත අර්බුද හා පුද්ගලයාට මුහුණ පාන්නට සිදු වන අර්බුද සමනය කරගන්නා ආකාරය මැනැවින් පෙන්වා දෙයි. ජනතාවගෙන් උපයා ගත් රාජ්‍ය භාණ්ඩාගාරය ජනතාවගේ ම සමෘද්ධිය පිණිස යෙදවීම මෙන් ම එතුළින් දිළිඳුකම තුරන් කිරීම අරමුණු කරගත් රාජ්‍ය පාලනයක් පිළිබඳ ව පෙන්වා දෙන දීඝ නිකායේ කූටදන්ත සූත්‍රයේ දී රාජ්‍ය පාලකයන් රාජ්‍යයේ කෘෂිකාර්මික, කාර්මික, වාණිජ, රාජ්‍ය සේවය යනාදි අංශ කෙරෙහි පමණක් නො ව තම ස්වයං ශක්තියෙන් නැගී සිටීමට නොහැකි ජනතාව කෙරේද අවධානය යොමුකර කටයුතු කළ යුතු බව පෙන්වා දෙයි. දිළිඳුකම පිටුදැකීම විෂයෙහි පෞද්ගලික දායකත්වය ද අගය කොට සලකන බුදුදහම බාහු බලය යොදා ධාර්මික ව ධනය උපයාගත යුතු බවත් නිසි අයුරින් ධනය වියපැහැදම් කිරීම හා ආයෝජනය කිරීමත් මෙන් ම ධනය ඉතිරි කිරීමත් කළ යුතු බව පෙන්වා දෙයි. ඒ අනුව බෞද්ධ ආර්ථික චින්තනය තිරසාර සංවර්ධනය අරමුණු කරගත් දූරදර්ශී පදනමක් සහිත උභයාර්ථ සාධනයයෙහි ම පවතින්නක් බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** ආර්ථිකය, උභයාර්ථ සාධනය, තිරසාර සංවර්ධනය, දිළිඳුකම, බුදුදහම

[1] නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය. chamoayesha9653@gmail.com
[2] නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය. dhammajeewa1@gmail.com